තැපැල් සේවා අමාත්‍යාංශය
தபால் சேவைகள் அமைச்சு
# MINISTRY OF POSTAL SERVICES

6 සහ 7 වැනි මහල, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
6 ஆம் 7 ஆம் மாடி, தபால் தலைமையகம், 310, டி. ஆர். விஜேவர்தன மாவத்தை, கொழும்பு 10. 6th and 7th Floors, Postal Headquarters Building, 310, D.R.Wijewardhana Mawatha, Colombo 10.

මගේ අංකය / எனது இல. / My No. 12121 උපගොනුව
ඔබේ අංකය / உமது இல. / Your No. 11/01/61/2011
දිනය / திகதி / Date 2012.12. 03

තැපැල්පති,

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සංශෝධිත බඳවාගැනීමේ පරිපාටි සඳහා නිර්දේශ ලබාදීම.</u>
<u>තැපැල් දෙපාර්තමේන්තුව.</u>
<u>කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ තනතුරු. MN 7 - 2006 (A)</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබට ද පිටපතක් සහිතව මා වෙත යොමු කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/4/1/28/1/3/2012 හා 2012.11.29 දිනැති ලිපිය හා බැඳේ.

ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීමේ පරිපාටිය තැපැල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරන ලෙසත් දන්වා සිටිමි.

ඒ.එස්.එම්.එස්.මහානාම
අතිරේක ලේකම් (පාලන)
තැපැල් සේවා ලේකම් වෙනුවට

පිටපත :
1. ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව. - ඔබේ අංක PSC/EST/4/1/28/1/3/2012 හා 2012.11.29 දිනැති ලිපිය පරිදි කරු.දැ.ගැ.පි.
2. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - උක්ත බඳවාගැනීමේ පරිපාටිය අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකිරීම සඳහා පිටපතක් මේ සමඟ එවමි.

# ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි

## කළමනාකරණ සහකාර - අධි පංතියේ
## තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

**1. සම්බන්ධවන ආයතන :**

1.1. දෙපාර්තමේන්තුව : තැපැල් යොමු අංකය:- 11/01/61/2011 දිනය:- 2011.06.09

1.2. අමාත්‍යාංශය : තැපැල් සේවා යොමු අංකය:- 12121 දිනය:- 2011.06.09

1.3. කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය:- DMS/C04/28-01 දිනය:- 2011.07.28

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය:- EST-2/RECRU/05/5022 දිනය:- 2011.09.21

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය යොමුඅංකය:-NSCC/02/28/1/SR-1 දිනය:- 2011.05.25

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යොමු අංකය:- PSC/EST/4/1/28/3/2012 දිනය:- 2012.10.04

**2. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර**

2.1. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : කළමනාකරණ සහකාර අධි පංතිය

3.2. ශ්‍රේණි : මෙම සේවා ගණයට ශ්‍රේණි ක්‍රමයක් නැත.

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ නිර්වචනය :

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව යටතේ පවත්නා පරිපාලන ඒකක හා තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල වල ආයතන හා මූල්‍ය පරිපාලනය, තැපැල් සේවා හා තැපැල් මෙහෙයුම් කටයුතු හා වාණිජ කටයුතු ඵලදායී ලෙස පවත්වා ගෙන යාම සඳහා විධායක ශ්‍රේණිවල කාර්ය භාරයන්ට සහාය හා අනුපූරක සහයෝගීතාව සැපයීමෙහි ලා අවශ්‍ය වන්නාවූ ආයතන හා පරිපාලන කාර්යයන්, මෙහෙයුම් හා කළමනාකරණ කාර්යයන්, විමර්ශන හා ගිණුම් පරීක්ෂණ කාර්යයන් පැවරෙන්නාවූ කළමනාකරණ සහකාර තාක්ෂණ හා තාක්ෂණ නොවන සේවා ගණ වල හා අධීක්ෂණ කළමනාකරණ සේවා ගණ වල අධි ශ්‍රේණිය ලෙස ගැනෙන නිලධාරීන්ගෙන් සමන්විත සේවා ගණයකි.

**4. තනතුරේ ස්වභාවය :**

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි

## 5. වැටුප් :-

5.1. වැටුප් කේත අංකය :- MN 7 - 2006 (ඒ)

5.2. වැටුප් පරිමාණය :- 20,030 - 11 x 365 – 18 x 500 – 33,045

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| සේවා ගණය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| කළමනාකරණ සහකාර අධි පංතිය | පියවර 04 | 21,125 |

## 6. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| | අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 1 | සහකාර තැපැල් අධිකාරී (විමර්ශන) | | 51 | උප ලේඛණය I හි දැක්වේ |
| 2 | සහකාර තැපැල් අධිකාරී (ගිණුම් පරීක්ෂණ) | | 40 | උප ලේඛණය I හි දැක්වේ |
| 3 | සහකාර තැපැල් අධිකාරී (ප්‍රධාන තැපැල් කාර්යාලය) | | 53 | උප ලේඛණය I හි දැක්වේ |

6.2. ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාව :-

සහකාර තැපැල් අධිකාරී (විමර්ශන) - 51
සහකාර තැපැල් අධිකාරී (ගිණුම් පරීක්ෂණ) - 40
සහකාර තැපැල් අධිකාරී (ප්‍රධාන තැපැල් කාර්යාලය) - 53

## 7. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1. බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | නැත |
| සීමිත | 100% |
| කුසලතා | නැත |

7.2. විවෘත බඳවා ගැනීම : අදාල නොවේ

7.3. සීමිත බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය :
කළමනාකරණ සහකාර අධි පංතිය ශ්‍රේණි ක්‍රමයක් නැත.

7.3.2. සුදුසුකම්:

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.3.2.3. පළපුරුද්ද :

(අ). තැපැල් සේවා නිලධාරී Iශ්‍රේණියේ තනතුරක වසර එකක (01) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

7.3.2.4. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

(i). අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ii). තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය 7.3.2.3 යටතේ වූ පළපුරුද්ද, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3. වයස :

7.3.3.1. අවම සීමාව : අදාල නොවේ.
7.3.3.2. උපරිම සීමාව : අදාල නොවේ.

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම් ක්‍රමයක් බැවින් වයස් සීමාව අදාල නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i. | ආයතන රෙගුලාසි | 100 | 40% |
| ii. | මූල්‍ය පරිපාලනය | 100 | 40% |
| iii. | දෙපාර්තමේන්තු ව්‍යවස්ථා සහ කාර්ය පටිපාටි | 100 | 40% |
| iv. | කළමනාකරණය සහ කාර්යාල ක්‍රම | 100 | 40% |

විෂය නිර්දේශය උපලේඛණයII හි දැක්වේ.

7.3.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.3.4.2. වෘත්තීය පරීක්ෂණ : අදාල නොවේ.

7.3.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබනශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් පරීක්ෂාකිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.3.4.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම :- අදාල නොවේ.

**8. කාර්යක්ෂමතා කඩඉම :** අදාල නොවේ.

**9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :**
**9.1.**

| | ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | කළමනාකරණ සහකාර අධි පන්තිය බැවින් අදාල නොවේ. |
| 02 | අනෙක් රාජ්‍ය භාෂාව | අදාල නොවේ. |

**10.** ශ්‍රේණි උසස් කිරීම: අදාල නොවේ

## 11. තනතුරු වලට පත් කිරීම

11.1. සුදුසුකම් :

| තනතුර | සුදුසුකම් |
| --- | --- |
| සහකාර තැපැල් අධිකාරී (විමර්ශන)<br>සහකාර තැපැල් අධිකාරී (ගිණුම් පරීක්ෂණ)<br>සහකාර තැපැල් අධිකාරී (ප්‍රධාන තැපැල් කාර්යාලය) | අධි පන්තියේ නිලධරයෙකු වීම |

11.2. තෝරා ගනු ලබන ක්‍රමය :

බඳවා ගන්නා අවස්ථාවෙහි ඒ ඒ තනතුරුවල පවත්නා පුරප්පාඩු අනුව සහ අයදුම්කරුවන් විසින් අයදුම්පතෙහි සඳහන් කර ඇති මනාපය පරිදි ලිඛිත පරීක්ෂණයේ ලබා ගත් ලකුණු පාදක කොට ගෙන යෝග්‍ය තනතුරකට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ඇත.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :

මෙම සේවා ගණයට පත්වන නිලධාරීන් පත්වීම් ලබා තනතුරු රාජකාරි භාර ගැනීමට පෙර තැපැල්පති නියම කරනු ලබන ප්‍රාරම්භක පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරි බාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

13.1. "ශ්‍රී ලංකා තැපැල්කාර්යාල චක්‍රලේඛය" යන්නෙන් අදහස් කරනුයේ සතිපතා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අභ්‍යන්තර දැන්වීම් ප්‍රකාශනයයි.

## 14. නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම

උපලේඛණය III හි දැක්වේ

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16.** මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| සකස්කළේ : අත්සන : | ........................................ | | පරීක්ෂා කළේ : අත්සන :- | | ........................................ |
| නම | : | පී.ඩබ්.පී. විජේසිංහ | නම | : | අශෝක මාම්පිටියආ... |
| තනතුර | : | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) | තනතුර | : | නියෝජ්‍ය තැපැල්පති |
| දිනය | : | 2012.10. 18 | දිනය | : | 2012.10. 18 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

දිනය : 2012.10. 19 . නිල මුද්‍රාව : ........................................

යොමු අංකය : 12121

MN 7 - 2006 (ඒ)හා කළමනාකරණ සහකාර - අධි පංතියේතනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................

නම : හේමසිරි ප්‍රනාන්දු
ලේකම්,
තැපැල් සේවා අමාත්‍යාංශය

හේමසිරි ප්‍රනාන්දු
ලේකම්
තැපැල් සේවා අමාත්‍යාංශය
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල.
අංක. 310, ඩී. ආර්. විජේවර්ධන මාවත.
කොළඹ 10

දිනය : 2012.10.31 නිල මුද්‍රාව : ........................................

යොමු අංකය : PSC / EST /4/1/28/1/3/2012

MN 7 - 2006 (ඒ)හා කළමනාකරණ සහකාර - අධි පංතියේතනතුරු සඳහාවන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2012-10-04.......... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවවිසින් අනුමත කරන ලදී.

අත්සන : ........................................

නම : ........................................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම් ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

දිනය : 2012 - 11 - 27 .......................... නිල මුද්‍රාව : ........................................

උප ලේඛණය I

## කළමනාකාරණ සහකාර - අධි පන්තියේ නිලධරයන්ගේ තනතුරු අනුව කාර්යයන්

01. සහකාර තැපැල් අධිකාරී (විමර්ශන)

1. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ විනය හා පැවැත්ම පිළිබඳ මූලික විමර්ශන පැවැත්වීම.
2. තැපැල් හා උප තැපැල් කාර්යාලවල මූල්‍ය ගණුදෙණු , ගිණුම්, ආදායම් හා වත්කම් විමර්ශනය.
3. ලියුම් පෙට්ටි, ජංගම තැපැල් සේවා, තැපැල් ප්‍රවාහණ සේවා පිළිබඳ විමර්ශනය.
4. දෙපාර්තමේන්තුව සතු ස්ථාවර හා ජංගම වත්කම් හා දේපල අලාභ හානි, සොරකම්, අපහරණයන් විමර්ශනය.
5. තැපැල් සේවා ජාලයෙහි මහජන සේවාවල පැමිණිලි අක්‍රමිකතා හා දූෂණ විමර්ශනය.
6. දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධිකරණයේ නියෝජනයවීම හා නඩු කටයුතු වල සාක්ෂි දීම.

02. සහකාර තැපැල් අධිකාරී (ගිණුම් පරීක්ෂණ)

1. තැපැල් කාර්යාල, දිස්ත්‍රික් ගිණුම් කාර්යාල, දිස්ත්‍රික් පාලන කාර්යාල, මධ්‍ය තැපැල් හුවමාරු අංශය යන ඒකක වල ගිණුම් පරීක්ෂා කර සහතික කිරීම.
2. දෙපාර්තමේන්තු නිලධාරීන් විමර්ශන හා පරීක්ෂණ ක්ෂේත්‍රවල පුහුණු කිරීම.
3. විශේෂ හා හදිසි මූල්‍ය පරීක්ෂණ කිරීම.
4. රාජ්‍ය දේපල, මුදල්, වත්කම් වල අලාභ හානි පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම.
5. වංචා හා අක්‍රමිකතා පුළුල් ලෙස විමර්ශනය කර වාර්තා කිරීම.

03. සහකාර තැපැල් අධිකාරී (ප්‍රධාන තැපැල් කාර්යාලය)

ප්‍රධාන තැපැල් කාර්යාල හා ඒ යටතේ පාලනය වන උප තැපැල් කාර්යාල හා තැපැල් සේවා ඒකක වල.

1. සමස්ථ කළමනාකරණය හා අධීක්ෂණය.
2. සේවක පරිපාලනය හා වැඩ අධීක්ෂණය.
3. වත්කම් පාලය හා රාජ්‍ය මුදල් හා භාණ්ඩ වල වගකීම් පරිපාලනය.
4. තැපැල් සේවා හා මෙහෙයුම් කටයුතු පරිපාලනය.
5. තැපැල් කවුළු මගින් කෙරෙන මහජන සේවා මෙහෙයුම.
6. තැපැල් භාණ්ඩ රැස් කිරීම, ප්‍රවාහණය, බෙදා හැරීම පිළිබඳ ක්‍රියාවලිය මෙහෙයවීම.

සකස්කලේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2012.10. 18

පරීක්ෂා කලේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2012.10. 19

අත්සන : ..............................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : 2012.10. 19

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

උප ලේඛණය II

01. විභාගයේ නම : කළමනාකාරණ සහකාර - අධි පන්තියේතනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| i. | ආයතන රෙගුලාසි | පැය 03 | 100 | 40% |
| ii. | මූල්‍ය පරිපාලනය | පැය 03 | 100 | 40% |
| iii. | දෙපාර්තමේන්තු ව්‍යවස්ථා කාර්ය පටිපාටි | පැය 03 | 100 | 40% |
| iv. | කළමනාකරණය සහ කාර්යාල ක්‍රම | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය මත පවත්වනු ලැබේ.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | | විෂය නිර්දේශය |
|---|---|---|---|
| (i). | ආයතන රෙගුලාසි | 1 | ආයතන සංග්‍රහය 1 කාණ්ඩය |
| | | 2 | ආයතන සංග්‍රහය 11 කාණ්ඩය |
| | | 3 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති |
| (ii). | මූල්‍ය පරිපාලනය | 1 | මුදල් රෙගුලාසි සංග්‍රහය<br>I, II, IIIහා IV පරිච්ඡේද සහ<br>XI, XII, XIII, හා XIV පරිච්ඡේද |
| | | 2 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා කාර්ය පටිපාටි සංග්‍රහය |
| (iii). | දෙපාර්තමේන්තු ව්‍යවස්ථා කාර්ය පටිපාටි | 1 | තැපැල් කාර්යාල ව්‍යවස්ථාව |
| | | 2 | තැපැල් ස්ථානාධිපති අත්පොත |
| | | 3 | තැපැල් මග |
| | | 4 | සුළු සේවක ව්‍යවස්ථාව |
| | | 5 | දෙපාර්තමේන්තු චක්‍රලේඛ |
| | | 6 | දෙපාර්තමේන්තු කාර්ය පටිපාටි |

| | | | |
|---|---|---|---|
| (iv). | කළමනාකරණය සහ කාර්යාල ක්‍රම | 1 | කළමනාකරණ මූලධර්ම |
| | | 2 | සංනිවේදනය හා මහජන සබඳතා |
| | | 3 | නව කළමනාකරණ ක්‍රමවේද හා සංකල්ප |
| | | 4 | ගැටළු නිරාකරණය හා සේවක අභිප්‍රේරණය |
| | | 5 | කාර්යාල ක්‍රම හා විධි |

සකස්කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2012.10. 18

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2012.10. 18

අත්සන : ..............................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : 2012.10. 19.

ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

නිල මුද්‍රාව : ..............................

උප ලේඛණය III

**සේවයේ යෙදී සිටින පාලන සහකාරවරුන්, ප්‍රධාන තැපැල් ස්ථානාධිපතිවරුන්, තැපැල් කාර්යාල විමර්ශන පරීක්ෂකවරුන් හා තැපැල් ගිණුම් පරීක්ෂකවරුන් කළමනාකාරණ සහකාර - අධි පන්තියේ තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීම**

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ තැපැල් සේවාවේ "අ" කාණ්ඩයේ 111 ශ්‍රේණියේ "ආ" ඛණ්ඩයේMN 7 – 2006 (ඒ)වැටුප් පරිමාණය ලබන පාලන සහකාර, ප්‍රධාන තැපැල් ස්ථානාධිපති තනතුරු දරණ නිලධාරීන් සහකාර තැපැල් අධිකාරී (ප්‍රධාන තැපැල් කාර්යාලය) වශයෙන්ද, තැපැල් කාර්යාල විමර්ශන පරීක්ෂකවරුන් සහකාර තැපැල් අධිකාරී (විමර්ශන) වශයෙන්ද, තැපැල් ගිණුම් පරීක්ෂකවරුන් සහකාර තැපැල් අධිකාරී (ගිණුම් පරීක්ෂණ) වශයෙන්ද, මෙම නිලධර ගණයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. අන්තර්ග්‍රහණය හේතුකොට ගෙන වැටුපෙහි, වැටුප් වර්ධක දිනයෙහි හෝ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවයෙහි වෙනසක් සිදු නොවේ.

සකස්කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2012.10. 18

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2012.10. 18

අත්සන : ..............................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : 2012.10. 19

ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

නිල මුද්‍රාව : ..............................